ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2022-09-08 |

පැමිණිලි පාර්ශවය : එන්. නසීම් මිය,
200/05/දළුපිටිය පාර,
මහර, කඩවත.

වගඋත්තර පාර්ශවය : විදුහල්පති,
විද්‍යාචන්ද්‍ර මහා විද්‍යාලය,
දළුපිටිය,
මහර, කඩවත.

**පැමිණිලි අංකය : HRC/1288/19**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කර ඇති 2019.05.09 දිනැති පැමිණිල්ල මඟින් සඳහන් කර ඇත්තේ, 2019.05.08 වන දින තම දියණිය ඉගෙනුම ලබන පාසල වන ඉහත දළුපිටිය විද්‍යාචන්ද්‍ර විද්‍යාලය වෙත එහි පැවැත්වෙන රැස්වීමක් සඳහා සහභාගී වීමට ගිය අවස්ථාවේ තමා ISIS ත්‍රස්තවාදී සංවිධානයට සම්බන්ධ බවට චෝදනා කරමින් තමා ඇඳ සිටි අබායා ඇඳුම සහ හිස් ආවරණය කර සිටි හිජාබ් ආවරණය ඉවත් කර පැමිණෙන ලෙස ඒ අවස්ථාවේ පාසල් ගේට්ටුව අසල රැඳී සිටිමින් අදාළ රැස්වීම සඳහා පැමිණෙන දෙමාපියන් ඇතුළු පුද්ගලයින් පරීක්ෂා කරමින් සිටි ගුරුභවතුන් ඇතුළු දෙමාපියන් විසින් තමන්ට තර්ජණය කළ බවයි.

මෙම සිද්ධිය හේතුවෙන් තමා සහ තම දියණිය පීඩාවට සහ බරපතල අපහසුතාවයට පත්වූ බවත්, ඒ වන විට රජය මඟින් හෝ අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් හෝ මුස්ලිම් කාන්තාවන්ගේ ඇඳුම් සහ හිස මුහුණු ආවරණ සම්බන්ධව නීතිරීති රෙගුලාසි පනවා නොතිබූ බවත්, එම තත්වය තුළ මෙම පාසලේ විදුහල්පතිවරයා ඇතුළු පාසල් පරිපාලනය විසින් අත්තනෝමතිකව මේ ආකාරයෙන් කටයුතු කිරීම



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. සභාපති ෆැක්ස් ඊමේල්

නීතියට පටහැනි තත්වයක් බව පෙන්වා දී ඇති පැමිණිලිකාරිය මේ සම්බන්ධව කඩිනම් විමර්ශනයක් සිදුකර සහනයක් සලසා දෙන ලෙස තම පැමිණිල්ල මඟින් ඉල්ලා ඇත.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

මෙම පැමිණිල්ලට අදාළව මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ සිදුකරන ලද 2019.06.04 දිනැති පරීක්ෂණය සඳහා වගඋත්තරකාර විද්‍යාලයේ වැඩබලන විදුහල්පති වන ලාල් අමරසිරි මහතා ඇතුළු ගුරුභවතුන් සිව් දෙනකු සහ පාසල් සංවර්ධන සමිතිය සහ පාසලේ ආදි ශිෂ්‍ය සංගමය නියෝජනය කරමින් දෙමාපියන් කිහිප දෙනකු ද සහභාගී වී ඇත.

එහිදී වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කර ඇත්තේ, මෙම පැමිණිල්ලට අදාළ ප්‍රශ්නගත සිද්ධියේ විදුහල්පතිවරයා ඇතුළු පාසල් පරිපාලනය සහ දෙමාපියන් ඒ වන විට රටේ පැවැති වාතාවරණය මත පාසලේ අධ්‍යාපනය ලබන දූ දරුවන් ඇතුළු සියලූ දෙනාගේ ආරක්ෂාව තහවුරු කිරීම පිණිස සාකච්ඡා කර ආරක්ෂක වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ බවත්, එහිදී පාසලට ඇතුළු වන සිසුන් දෙමාපියන් ඇතුළු සියලූ දෙනා පරීක්ෂාවට ලක් කළ බවත්, එහිදී මුස්ලිම්, සිංහල, දෙමළ වශයෙන් ජනවාර්ගික භේදයකින් තොරව සියළු දෙනා පරීක්ෂාවට ලක්කර අදාළ රැස්වීම සඳහා සහභාගී කරගත් බවත්, එහිදී මෙම පැමිණිලිකාරිය වන නූර් නසීම් මහත්මියට හෝ ඇයගේ දියණියට අපහසුතාවයක් ඇතිවන ආකාරයෙන් කටයුතු නොකළ බවත් සඳහන් කර ඇත.

විශේෂයෙන්ම අප්‍රේල් 21 වන පාස්කු ඉරු දින ලංකාවේ කතෝලික දේවස්ථාන කිහිපයක් සහ ප්‍රධාන පෙළේ හෝටල් කිහිපයක සිදුවූ ත්‍රස්තවාදී ප්‍රහාරයන්ගෙන් පසුව රටේ ඇති වූ ව්‍යාකූල තත්වය තුළ ආරක්ෂක අංශ විසින් සිදුකළ පරීක්ෂාවන්හිදී මෙම පාසලට ආසන්න එඬේරමුල්ල ප්‍රදේශයෙන් එම ප්‍රහාරවලට සම්බන්ධ සැකකාර පුද්ගලයින් සහ අවිආයුධ ආදිය අත්අඩංගුවට ගෙන තිබීම හේතුවෙන් එම ප්‍රදේශවල ආරක්ෂාව සම්බන්ධව ප්‍රදේශවාසීන් තුළ වැඩි උනන්දුවක් පැවැති බවද වගඋත්තරකාර පාර්ශවය පරීක්ෂණයේදී සඳහන් කර ඇත.

විදුහල්පති සඳහන් කරන පරිදි මෙම පාසලේ සිංහල, මුස්ලිම්, දෙමළ යන ප්‍රධාන ජනවර්ග තුනටම අයත් දරුවන් අධ්‍යාපනය ලබන බවත්, 2019.05.08 වන දින පාසලේ පැවැති රැස්වීම සඳහා පැමිණ සිටි අනෙකුත් මුස්ලිම් ජාතික මවුවරුන් ඇතුළු දෙමාපියන් ආරක්ෂක රාජකාරී සඳහා අවශ්‍ය සහය ලබා දී ඇති බවත්, නූර් නසීම් මහත්මිය ද මීට පෙර පාසලේ පොදු කටයුතු වලදී ක්‍රියාකාරී දායකත්වයක් පාසල් පරිපාලනය වෙත ලබා දී ඇති බවත් වගඋත්තරකාර පාර්ශවය සඳහන් කර ඇත. එබැවින් මෙම රැස්වීම පැවැති දිනයේ නූර් නසීම් මහත්මිය එම ආරක්ෂක කටයුතු වලට සහයෝගය ලබා දෙමින් කටයුතු කරනු

ඇතැයි අපේක්ෂා කළ බවත්, කෙසේ වෙතත් තමන් පෙර සඳහන් කර ඇති පරිදි ඇය හෝ ඇයගේ දියණියගේ අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් තමන් මෙහිදී කටයුතු කර නොමැති බවත්, ඒ වන විට රටේ පැවැති වාතාවරණය මත පාසල් පරිපාලනය සහ දෙමාපියන් ඇතුළුව පාසල් සංවර්ධන සමිතිය, ආදි ශිෂ්‍ය සංගමය සාකච්ඡා කර සකසා ගත් ක්‍රමවේදයක් මත සත්භාවයෙන් මෙහිදී විදුහල්පතිවරයා ඇතුළු පාසල් පරිපාලනය කටයුතු කර ඇති බවත්, නූර් නසීම් මහත්මිය හෝ ඇයගේ දියණියට යම් අපහසුතාවයක් ඇති කිරීමට චේතනාන්විතව මෙහිදී කටයුතු කර නොමැති බවත්, වැඩිදුරටත් සඳහන් කර ඇත.

එදින පරීක්ෂණයේදී පරීක්ෂණ නිලධාරී විසින් ලබා දී ඇති උපදෙස් පරිදි මීට අදාළ විධිමත් ලිඛිත කරුණු දැක්වීමක්ද වැඩබලන විදුහල්පති විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති අතර, ඉහත දින පරීක්ෂණයේදී සඳහන් කර ඇති කරුණු වලට අමතරව අදාළ සිද්ධිය අවස්ථාවේ පැමිණිලිකාරිය වන නූර් නසීම් මහත්මිය ප්‍රකෝපකාරීව හැසිරීම හේතුවෙන් තත්වය ව්‍යාකූල වී ඇති බව සඳහන් කර ඇත.

කෙසේ වෙතත් මෙදින පරීක්ෂණයේදී පරීක්ෂණ නිලධාරී විසින් පැමිණිල්ල මඟින් බලාපොරොත්තු වන සහනය විමසීමේදී පැමිණිලිකාරිය ප්‍රකාශ කර ඇත්තේ, තම දියණිය මෙම තත්වය තුළ තවදුරටත් ඉහත පාසලේ අධ්‍යාපනය ලැබීම සඳහා යොමු කිරීමට තමා බලාපොරොත්තු නොවන බවත්, ඒ අනුව දරුවා පාසලෙන් අස්කර ගැනීමට අවශ්‍ය බවත්ය. එහිදී වගඋත්තරකාර විදුහල්පති ඇතුළු පැමිණ සිටි ගුරුභවතුන් සහ සාක්ෂිකරුවන් ලෙස පැමිණ සිටි දෙමාපියන් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකාරියගේ දරුවා මෙම පාසලෙන් ඉවත් කරගැනීම අවශ්‍ය නොවන බවත් තවදුරටත් එම දැරිය විද්‍යාචන්ද්‍ර විද්‍යාලයේ අධ්‍යාපනය ලබනු දැකීම තම අපේක්ෂාව බවත්ය. එම නිසා මෙම දැරිය පාසලෙන් ඉවත් කර නොගන්නා ලෙස පැමිණිලිකාරිය වෙතින් ඉල්ලා ඇත.

**වගඋත්තර පාර්ශවයේ ලිඛිත කරුණු දැක්වීම :-**

පැමිණිල්ලට අදාළව ලිඛිත කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය දක්වා ඇත්තේ, 2019.05.08 වන දින පාසලේ ආරක්ෂාව පිළිබඳව සාකච්ඡා කර ගැනීම සඳහා දෙමාපියන් සඳහා විශේෂ රැස්වීමක් සංවිධානය කළ බවත්, ඒ සඳහා පැමිණෙන දෙමාපියන් පරීක්ෂාවට ලක් කිරීමෙන් පසුව පාසල් භූමියට ඇතුළු කරගැනීමට කටයුතු කළ අතර, මෙහිදී පාසලට මීටර් 100 ක් පමණ දුරින් පාසලේ ආචාර්ය මණ්ඩලයේ ගුරුවරුන් දෙදෙනෙකුගේ අධීක්ෂණය සහිතව මේ සඳහා පැමිණෙන දෙමාපියන් ඇතුළු සියළු දෙනා පරීක්ෂාවට ලක්කිරීම සිදුකරන ලද බවත්ය. මෙම රැස්වීම සඳහා සහභාගී වීමට යැයි පවසමින් එදින පැමිණ සිටි පැමිණිලිකාරිය වන නූර් මහත්මිය කළු පැහැති අබායා ඇඳුම සහ හිස් ආවරණය සහිතව පාසල් භූමියට ඇතුළු වීමට උත්සහ කරන අවස්ථාවේදී ආරක්ෂක රාජකාරී සිදුකරමින් සිටි දෙමාපියන් ඊට

අවස්ථාව ලබා දී නොමැති අතර, ඒ අවස්ථාවේ ඇයගේ අනන්‍යතාවය විමසීමේදී පැහැදිලිව ඒ පිළිබඳව ප්‍රකාශ කිරීමට අපොහොසත්ව ඇති බැවින්, සහකාර විදුහල්පති ගුණවර්ධන මිය සහ ආරක්ෂක කමිටු සාමාජික සංඛ නිදේශ් ගුරු මහතා විසින් එසේ පාසල් භූමියට ඇතුළු වීමට අවස්ථාව ලබා දිය නොහැකි බව ප්‍රකාශ කිරීම හේතුවෙන් මෙම පැමිණිලිකාරිය කලහකාරී ආකාරයෙන් එම ස්ථානයේ කටයුතු කර ඇති බව සඳහන් කර ඇත.

එම අවස්ථාවේ මෙම සිද්ධිය තමන් වෙත සැළවීමෙන් අනතුරුව වැඩබලන විදුහල්පති සහ තවත් ගුරුභවතුන් කිහිප දෙනකු එම ස්ථානයට පැමිණි බවත්, එහිදී මෙම පැමිණිලිකාරිය වෙත පවතින ආරක්ෂක වටපිටාව පිළිබඳව සහ කළු පැහැති අබායා ඇඳුම සහ හිස් ආවරණය සහිතව පාසල් භූමියට පිවිසීමට අවස්ථාව ලබා දිය නොහැකි බව කාරුණිකව පැහැදිලි කර දුන් බව දක්වා ඇත. එහිදී වඩාත් ප්‍රකෝපකාරී ලෙස කටයුතු කර ඇති පැමිණිලිකාරිය වැඩ බලන විදුහල්පති තමන් ඇතුළු ගුරුභවතුන් වෙත චෝදනා මුඛයෙන් කතා කරමින් ISIS සංවිධානය සාධාරණ බවත්, ඔවුන් ත්‍රස්තවාදී කටයුතු වලට යොමු වී ඇත්තේ මහජාතියේ වෙනස්කම් හේතුවෙන් බවත්, පාසල් භූමියට තමාට ඇතුළු වීමට ඉඩකඩ ලබා නොදෙන්නේ නම් ඒ බව ලිඛිතව ලබාදෙන ලෙස ප්‍රකාශ කර ඇති බවත්, ඒ අවස්ථාවේ තමා විසින් මෙම රැස්වීමට සහභාගී වන දෙමාපියන් පැමිණිය යුතු ආකාරය පිළිබඳ මීට පෙර දැනුවත් කර ඇති බැවින්, ඇය ඉල්ලා සිටින ආකාරයෙන් ලිපියක් ලබා දීමට හැකියාව නොමැති බව පැහැදිලි කරදුන් බවත්, ඒ අවස්ථාවේදී ඇය 'හොඳයි අපි බලාගමු' ආදී වශයෙන් තර්ජනාත්මකව ප්‍රකාශ කරමින්, එම ස්ථානයෙන් පිටව ගිය අතර, පසුව ඇය විසින් මේ සම්බන්ධව කඩවත පොලිස් ස්ථානය වෙත සහ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇති බවත් සඳහන් කර ඇත. ඉහත සඳහන් කර ඇති පරිදි මෙම සිද්ධියේදී තමා ඇතුළු ආචාර්ය මණ්ඩලය කටයුතු කර ඇත්තේ තමන් වෙත පැවරී රාජකාරී වගකීම් මත බවද වැඩිදුරටත් සඳහන් කර ඇත.

**විමර්ශනය :-**

වගඋත්තර පාර්ශවය ප්‍රකාශ කරන පරිදි පැමිණිලිකාරියගේ දියණිය දළුපිටිය විද්‍යාචන්ද්‍ර විද්‍යාලයේ තවදුරටත් අධ්‍යාපනය සඳහා යොමුකරන ලෙස ඉහත පරික්ෂණ දිනයේදී පරික්ෂණ නිලධාරී විසින්ද පැමිණිලිකාරිය වෙත උපදෙස් ලබා දී ඇති අතර, පාසලෙන් ඉවත් කර ගැනීමට අදහස් කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් විදුහල්පතිවරයා වෙතින් ඉල්ලීමක් සිදුකර අවශ්‍ය කටයුතු කරගන්නා ලෙසත් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව පැමිණිලිකාරිය වෙතින් එවැනි ඉල්ලීමක් ලැබී ඇත්නම් ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ කැමැත්ත පරිදි අදාළ ඉල්ලීම සම්බන්ධයෙන් කඩිනමින් අවශ්‍ය කටයුතු සිදුකරදෙන ලෙසට වගඋත්තරකාර විදුහල්පතිවරයා වෙතද උපදෙස් ලබා දී ඇත. එහිදී තම දරුවා වෙනත් පාසලකට ඇතුළත් කිරීමට අදහස් කරන්නේ නම්, අදාළ ඉල්ලීම කඩිනමින් කැළණිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත

ඉදිරිපත් කර ඉදිරි කටයුතු සලසා ගන්නා ලෙසද පරීක්ෂණ නිලධාරී විසින් පැමිණිලිකාරිය වෙත වැඩිදුරටත් උපදෙස් ලබා දී ඇත.

ඒ සඳහා පැමිණිලිකාරිය එකඟතාවය පළකර ඇති අතර, රටේ පවතින නීතිරීති හෝ අධ්‍යාපන අමාත්‍යාංශය හෝ පළාත් අධ්‍යාපන බලධාරීන් විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛන වලට පරිබාහිරව කටයුතු කරමින් පාසලේ දරුවන් හෝ එම දරුවන්ගේ දෙමාපියන් අපහසුතාවයට පත්කිරීමට විදුහල්පති හෝ පාසල් පරිපාලනයට හැකියාවක් නොමැති බවත්, මින් ඉදිරියට මෙවැනි සිද්ධි වලදී වඩාත් සැළකිලිමත්ව සහ වගකීමෙන් කටයුතු කිරීමට අවශ්‍ය බවත් මෙහිදී පරීක්ෂණ නිලධාරී විසින් වගඋත්තර පාර්ශවය වෙත දන්වා ඇත.

පැමිණිලිකාරිය තවදුරටත් ලංකා ගුරු සංගමයේ ලේකම් ජෝශප් ස්ටාලින් මහතා මඟින් දරුවාට එතෙක් පාසලක් ලැබී නොමැති බවත්, එමඟින් දරුවාගේ අධ්‍යාපනයට ඇති අයිතිය උල්ලංඝනය වූ බවත් දන්වා ඇත. ඒ අනුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, කැළණිය සමඟ සිදුකරන ලද දුරකථන සාකච්ඡාවකදී පැමිණිලිකාරියගේ දරුවාට සුදුසු පාසලක් ලබා දීමට එකඟතාවය පළ කර ඇති අතර, එකී එකඟත්වයට අනුව අදාළ දරුවා කැළණිය අධ්‍යාපන කලාපයේ ශ්‍රී රාහුල විද්‍යාලයට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දිය හැකි බවට දන්වා ඇත. නමුත් ඒ වන විට පැමිණිලිකාරියගේ දරුවා ජාත්‍යන්තර පාසලකට ඇතුළත් කර ඇති බැවින් මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම අවශ්‍ය නොවන බවට වාචිකව ප්‍රකාශ කර ඇත.

කෙසේ වෙතත්, මෙම ගැටළුව සම්බන්ධයෙන් විමසා බැලීමේදී එවකට රටේ පැවැති තත්වය සැළකිල්ලට ගෙන 2019.04.22 දින සිට හදිසි නීතිය පැනවීමට පාර්ලිමේන්තු යෝජනාවක් සම්මත කොටගෙන ඇති අතර, ඒ යටතේ ප්‍රසිද්ධ ස්ථානයකදී යම් තැනැත්තෙකු හඳුනාගැනීමට බාධාවක් ඇති වන ඇඳුම් සහ මුහුණු ආවරණ භාවිතා කිරීම තහනම් කරමින් ගැසට් පත්‍රයක් 2019.04.29 දින නිකුත් කර ඇත.

මෙම ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කිරීමෙන් පසුව විශේෂයෙන් මුස්ලිම් කාන්තාවන් වෙත ඔවුන්ගේ ඇඳුම්, හිස් සහ මුහුණු ආවරණ පැළඳීම පිළිබඳව එවකට සිදුවූ හිරිහැර සහ බාධා හේතුවෙන් මානව හිමිකම් කොමිෂන් සභාව ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුකර ඇති අතර, ඒ අනුව 2019.05.10 දාතමින් 'පාසල් වල ආරක්ෂක කටයුතු සිදුකිරීමේදී යම් ජන කොට්ඨාශයක් වෙනස්කමකට භාජනය නොවිය යුතු බව සහ එමඟින් වාර්ගික නොසන්සුන්තාවයක් ඇති නොවීමට කටයුතු කිරීම අවශ්‍ය වන බව' අවධාරණය කර ඇත.

තවද මෙම ලිපියේ අන්තර්ගතය පරිදි මුහුණු ආවරණය සහිත ඇඳුම් පිළිබඳව මාර්ගෝපදේශයක් නිකුත් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කොමිෂන් සභාවේ ගරු සභාපතිනිය සමඟ සිදුකළ දුරකථන සාකච්ඡාවකදී එකඟතාවය පළ කර ඇති බවද සඳහන් වේ.

**මෙම තත්වය සැළකිල්ලට ගැනීමේදී හදිසි නීති රෙගුලාසි සංශෝධනය කරමින් ජනාධිපතිවරයා නිකුත් කර ඇති නියෝග ඇතුළත් ගැසට් නිවේදනය මඟින් හෝ වෙනත් නීති ප්‍රතිපාදන මඟින් මුස්ලිම් කාන්තාවන්ගේ හිස් ආවරණ සම්පූර්ණයෙන් ඉවත් කළ යුතු බවට සඳහන් නොවන අතර, ඒ අනුව පැමිණිල්ලේ ප්‍රශ්නගත සිද්ධියේදී වගඋත්තරකාර විදුහල්පතිවරයා ඇතුළු ගුරුභවතුන් නීතියේ ප්‍රතිපාදන ඉක්මවා කටයුතු කර ඇති බව පෙනී යයි.**

තවද මෙම පැමිණිල්ලට අදාළව සිදුකර ඇති වැඩිදුර විමර්ශන වලදී පාර්ශවකරුවන් ඉදිරිපත් කර ඇති කරුණු දැක්වීම අනුව පහත නිරීක්ෂණ ඉදිරිපත් කළ හැකිය.

1. පැමිණිලිකාරිය මූලිකවම කොමිෂන් සභාවේ දක්වා ඇත්තේ, පාසල තුළදී තමා මුස්ලිම් ජාතික කාන්තාවක් වීම හේතුවෙන් ඇඳ සිටි ඇඳුම පදනම් කොටගෙන හිංසාකාරී තත්වයකට පත් කළ බවයි.
2. මේ පිළිබඳව පාර්ශවයන් වෙතින් ලද කරුණු පිළිබඳ අවධානය යොමු කිරීමේදී පාසල තුළදී යම් සිදුවීමක් සිදුවී ඇති බවට කරුණු නිරීක්ෂණය වේ.
3. එහිදී පැමිණිලිකාරිය හැඳ සිටි හිජාබය සමඟ පාසැල් භූමියට ඇතුල්වීමට ඉඩ ලබා නොදීම සහ වගඋත්තරකාර පාර්ශවය වෙතින් වාචිකව හරිහැරයක් සිදුවූ බවට පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කිරීමත් යන කාරණය සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ, පාසලේ පවතින නීතිරීති වලට අවනත නොවෙමින් පැමිණිලිකාරිය හිස් ආවරණය සහ කළු කබාය සහිතව පාසලට ඇතුළුවීමට උත්සහ දැරූ බවයි. ඒ අනුව උක්ත කරුණු දැක්වීම තුළ මෙම පැමිණිලිකාරියගේ අබාය ඇඳුම හා හිස් ආවරණය පිළිබඳ ප්‍රශ්නකාරී තත්වයක් උද්තව ඇති බව නිරීක්ෂණය වේ.
4. එහිදී දෙපාර්ශවය විසින්ම වාචිකව ප්‍රතිවිරුද්ධව කරුණු එම අවස්ථාවේ භාවිතා කළ බවට දෙපාර්ශවය විසින්ම දක්වා ඇති කරුණු අනුව නිරීක්ෂණය වේ.
5. තවද එම සිදුවීමෙන් පසු පැමිණිලිකාරිය විසින් තම දියණිය එම පාසලේ අධ්‍යාපනය සඳහා තවදුරටත් යොමු කිරීමට අකමැති බවත්, වෙනත් පාසලකට තම දියණිය ඇතුළත් කිරීමට අපේක්ෂා කරන බවත් දක්වා ඇති බව නිරීක්ෂණය වේ.

වැඩිදුරටත් වගඋත්තර පාර්ශවය 2019.08.02 දින පරික්ෂණයේදී දක්වා ඇත්තේ පාසලේ මුස්ලිම් ප්‍රජාවට අයත් දරුවන් 89 ක් පමණ අධ්‍යාපනය ලබන බැවින්, එම දරුවන්ට ගැටළුවක් ඇති නොවන ආකාරයෙන් ඉදිරියේදී කටයුතු කළ හැකි බවයි.

**නිගමනය :-**

මෙම පැමිණිල්ල සම්බන්ධව සිදුකර ඇති වැඩිදුර විමර්ශනයේදී පාර්ශවයන් ඉදිරිපත් කර ඇති කරුණු අනුව, 2019 මැයි 08 පැවැත්වීමට නියමිත රැස්වීමකට සහභාගී වීමට යාමේදී පැමිණිලිකාරිය සහ ඇගේ දියණිය පාසල් භූමියට ප්‍රවේශ වීම අවහිර කරමින් ඇයගේ හිස් ආවරණ ඉවත් කරගෙන පාසල් භූමියට ඇතුළු වන ලෙසට සිදුකර ඇති බලපෑම තුළින් වැඩබලන විදුහල්පතිවරයා ඇතුළු පාසල් පරිපාලනය නීතියෙ සීමාවන් ඉක්මවා යමින් කටයුතු කර ඇති බව නිගමනය කරන අතර, එමගින් පැමිණිලි පාර්ශවය වෙත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1), 12(2) වගන්ති මගින් සහතික කර දී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

කෙසේ වෙතත් මෙම වැඩිදුර විමර්ශනයේදී පැමිණිලි පාර්ශවය තවදුරටත් තම දියණිය විද්‍යාවන්ද්‍ර විද්‍යාලයේ අධ්‍යාපනය සඳහා යොමු කිරීමට කැමැත්තක් නොදක්වන බැවින්, බලාපොරොත්තු වන සහනය ලෙස දක්වා ඇත්තේ, එම පාසලෙන් ඉවත් කර වෙනත් පාසලකට ඇතුළත් කරගැනීම බැවින්, ඒ සඳහා අදාළ අධ්‍යාපන බලධාරීන් සමඟ සාකච්ඡා කර අවශ්‍ය මැදිහත්වීම සිදුකර ඇත.

තවද මේ වන විට පැමිණිලි පාර්ශවය තම කැමැත්ත මත එම දැරිය ජාත්‍යන්තර පාසලකට ඇතුළත් කරගෙන ඇත.

**නිර්දේශය :-**

ඒ අනුව, දළුපිටිය විද්‍යාවන්ද්‍ර විද්‍යාලයේ වැඩ බලන විදුහල්පති ලෙස කටයුතු කර ඇති ලාල් අමරසිරි මහතා ඇතුළු පාසල් පරිපාලනය ඉහත සිද්ධියේදී කටයුතු කර ඇති ආකාරය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1), 12(2) ව්‍යවස්ථා මගින් සහතික කර දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව අනාවරණය වන තත්වය තුළ එම විදුහල්පති ඇතුළු සිද්ධියට සම්බන්ධ ගුරුවරු සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගන්නා ලෙස බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කැළණිය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

තවද මෙවැනි තත්වයන් තුළදී වඩාත් සංවේදීව කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධව ගුරුභවතුන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් පාසල් මට්ටමින් පැවැත්වීමටද බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කැළණිය විසින් කටයුතු කිරීමටද නිර්දේශ කරනු ලැබේ.

2022. 10. 10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

මා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :-

1. ලේකම්,
බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,
පළාත් සභා ගොඩනැගිල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

2. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය,
කැළණිය.

ඉහත නිර්දේශය අනුව කටයුතු කිරීමට

B/